# GOVERNMENT & BUSINESS (Part-III)

***S. Madushanka***

***B.Sc (Mgt) Accounting (Special) (U.G)***

***University of of Sri Jayewardenepura***

## ෆිස්කල් ප්‍රතිපත්තිය යනු

රජයේ ආදායම් හා වියදම් සම්බන්ධව රජය සිදු කරන කටයුතු ෆිස්කල් ප්‍රතිපත්තිය ලෙස හැදින්වේ.

## ෆිස්කල් ප්‍රතිපත්තියේ අරමුණ

රජයේ ෆිස්කල් ප්‍රතිපත්තියේ අරමුණ, සාර්ව ආර්ථික ස්ථායීතාව ආරක්ෂා කර ගැනීම වේ.

## රාජ්‍ය ආදායම යනු

යම් ආර්ථිකයක මුදල් වර්ෂයක් තුළ බදු හා බදු නො වන මාර්ගවලින් ලැබෙන ආදායම රාජ්‍ය ආදායම වේ.

## රාජ්‍ය වියදම යනු

රජයක ආර්ථික අරමුණු ඉටු කර ගැනීම සඳහා වර්තන වියදම් හා ප්‍රාග්ධන වියදම් වෙනුවෙන් වර්ෂයක් තුළ දී කරනු ලබන මුළු වියදම රාජ්‍ය වියදම වේ.

රාජ්‍ය අයවැය ලේඛනය මගින් රජයේ පිස්කල් ප්‍රතිපත්තිය පිළිබිඹු වේ.

ClassWork.LK

# රාජ්‍ය ආදායම වර්ගීකරණය

- **රාජ්‍ය ආදායම**
  - බදු ආදායම
  - බදු නොවන ආදායම

# රජයේ බදු ආදායම වර්ගීකරණය

- **බදු ආදායම**
  - ආදායම් බදු
  - එකතුකල අගය මත බදු
  - නිෂ්පාදන බදු
  - ආයතන බදු
  - අනෙකුත් බදු

## බද්දක් යනු

බද්දක් යනු යම් පුද්ගලයකු හෝ ආයතනයක් විසින් අනිවාර්යයෙන් ම ගෙවිය යුතු යැයි රජය හෝ රජයේ බලාධිකාරී ආයතනයක් විසින් නියම කරනු ලබන ගෙවීමකි.

## ආදායම් බදු

පුද්ගලයින්ගේ හා ආයතනවල ආදායම මත අය කරනු ලබන බද්දකි.

**නිදසුන් :**

ClassWork.LK

සමාගම් බදු, උපයන විට ගෙවීම් බදු

## **එකතු කළ අගය මත බදු**

භාණ්ඩ හා සේවා මත එකතු කළ වටිනාකමට අය කරන බදු මත බදු එකතු කළ මත බදු අගය මත බදු වේ.

**නිදසුන් :**
තොග හා සිල්ලර වෙළෙඳාම මත එකතු කළ අගය මත බදු ආනයන මත එකතු කළ අගය මත බදු

## **නිෂ්පාදන බදු**

දේශීය වශයෙන් නිෂ්පාදනය කරන ඇතැම් භාණ්ඩ මත අය දේශීය භාණ්ඩ බදු කරන බදු

**නිදසුන් :**
සිගරට් හා දුම්කොල නිෂ්පාදන මත බදු, සුරා බදු

## **ආනයන මත බදු**

විදේශීය රටවල්වලින් ආනයනය කරන භාණ්ඩ සඳහා රේගුවේ දී අය කරන බදු වේ.

**නිදසුන් :**
මෝටර් රථ ආනයන මත බදු

ClassWork.LK

## <u>අනෙකුත් බදු</u>


ඉහත බදු වර්ගවලට අයත් නො වන එහෙත් අනෙකුත් පාර්ශ්වවලින් අයකරන බදු වර්ග ය.

**නිදසුන් :**

වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බදු සෙස් බද්ද, විදුලි සංදේශ බදු

ClassWork.LK

# බදු ආදායම සෘජු බදු හා වක්‍ර බදු ලෙස වර්ගීකරණය




## සෘජු බදු යනු

පුද්ගලයන්ගේ හෝ ව්‍යාපාරවල ආදායම මත හෝ වත්කම් මත අය කරනු ලබන, ගෙවන පුද්ගලයා විසින් ම දැරිය යුතු බදු සෘජු බදු වේ.

## වක්‍ර බදු යනු

භාණ්ඩ හා සේවා මත අය කරනු ලබන, ගෙවන ලද බද්ද වෙනත් පාර්ශ්වයකට විතැන් කළ හැකි බදු වක්‍ර බදු වේ.

ClassWork.LK

# <u>රජයේ බදු නො වන ආදායම් වර්ගීකරණය</u>

බදු නො වන ආදායම

- ලාභ හා ලාභාංශ වෙනත් නිදසුන් : රජයේ ආයතනවලින් ලද ලාභ හා ලාභාංශ
- ගාස්තු හා අයකිරීම් නිදසුන් : මෝටර් රථ සඳහා ආදායම් බලපත්‍ර ගාස්තු හා
- පොලී ආදායම්
- වෙනත් නිද්සුන් : ලොතරැයි ආදායම

ClassWork.LK

# රාජ්‍ය වියදම් වර්ගීකරණය

**රාජ්‍ය වියදම**

- **වර්තන වියදම්**
- **ප්‍රාග්ධන වියදම්**

## වර්තන වියදම්

රාජ්‍ය සේවා අඛණ්ඩ ව පවත්වා ගැනීම සඳහා වසරක් තුළ නැවත නැවත සිදු කළ යුතු වියදම් ය. මේවා පුනරාවර්තන වියදම් ලෙස ද හඳුන්වයි.

**නිදසුන් :**

වැටුප් හා වේතන, පොලී ගෙවීම්

## ප්‍රාග්ධන වියදම්

රජයක් විසින් දිගුකාලීන ආයෝජන සඳහා දරන වියදම් ප්‍රාග්ධන වියදම් වේ.

**නිදසුන් :**

මහාමාර්ග ඉදිකිරීම

පාලම් ඉදිකිරීම

ClassWork.LK

රජයේ ආදායම් හා වියදම් සංයුතිය අයවැය යෝජනා ඉදිරිපත් කිරීමත් සමග වෙනස් විය හැකි ය

රජය විවිධ අවස්ථාවල දී විවිධ බදු වර්ග පනවන අතර විවිධ බදු වර්ග අහෝසි කිරීම ද කරනු ලැබේ. බදුවලින් ලබන ආදායම රජයේ විවිධ ව්‍යාපෘති සඳහා වැය කරයි.

**නිදසුන් :**
මාර්ග ඉදිකිරීම, ගුවන් තොටුපොල ඉදිකිරීම හා සංවර්ධනය, වරාය සංවර්ධනය

## රජයේ පිස්කල් ප්‍රතිපත්තිය ව්‍යාපාරවලට බලපාන ආකාරය

ආනයනික භාණ්ඩ සඳහා රේගු බදු අය කිරීමෙන් ආනයන සීමා වන අතර ම දේශීය නිෂ්පාදනය වර්ධනය කර ගත හැකි ය. /දේශීය කර්මාන්ත ආරක්ෂා කර ගත හැකි වේ.

දේශීය නිෂ්පාදිත මත බදු අය කිරීමෙන් භාණ්ඩ හා සේවාවල මිල ඉහළ යාම සිදු විය හැකි ය.

රජය, යටිතල පහසුකම් මත වියදම් දැරීම නිසා ව්‍යාපාරික කටයුතු පහසු කෙරේ.

ClassWork.LK

2021
2022
2023

# උසස් පෙළ

ගිණුම්කරණය
ආර්ථික විද්‍යාව
ව්‍යාපාර අධ්‍යයනය

2021
2022

# සාමාන්‍ය පෙළ

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

## තනි හෝ කණ්ඩායම් පන්ති

(English & Sinhala Medium)

# 0763655550

S. Madushanka
B.Sc (Mgt) Accounting (Special) (U.G)
University of of Sri Jayewardenepura